




# ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ පොත් දෙකක් ප්‍රතිමාවක් සංක්‍රමණිකයෙක් සහ දරුවෙක් සමග මේ අපේ ලොවයි

පළමුවැන්න කෙටි කතා දහයක එකතුවකි. අනෙක් ළමා පොතකි - කතන්දරයකි.

2010 දී පළ කරන ලද "පරමේෂ්වරී සහ වෙනම රටක්" ලිවීමෙන් පසු ලක්ස්මන් කොඩිතුවක්කු කෙටි කතා රචකයකු වශයෙන් ලබා ඇති සැළකිය යුතු දියුණුව මේ ඔහුගේ නව කෙටිකතා සංග්‍රහයෙන් පිලිබඹු වන බව පළමුව කිව යුතුය.

ගණනින් වැඩි වන පොත් සංඛ්‍යාවකට වඩා අගයෙන් ඉදිරියට යන නිමැවුම් පාඨක හමුවට ගෙන ඒම ලේඛකයකුගේ - නිර්මාපකයකුගේ ප්‍රගතිය මෙන් ම සාහිත්‍යයට කරන සම්මාදමද ... ඉදිරියට යන බව කිව යුතු නොවුවද එය අවදාරණය කළ යුත්තේ ඒ ලක්ෂණය හෙවත් යථාර්ථය පොදු ලක්ෂණයක් හැටියට බොහෝ දෙනකු වෙතින් පළ නොවන හෙයිනි.

ඒ සමගම අවධාරණය කළ යුතු දෙයක් ඇත. ඒ මා මේ ලියන විස්තරය සාමාන්‍ය ග්‍රන්ථ විචාරයකින් වෙනස් වන බව ය. ලක්ෂ්මන්ගේ සාහිත්‍ය මෙහෙවර ඔස්සේ පොදුවේ පොදුවේ ගත යුතු මෙරට සිංහල සාහිත්‍යයද විමසීමට ලක් කළ යුතුය. එසේ කිරීමට ප්‍රධාන හේතුව වනුයේ මා සිතූ තරමට - පැතූ තරමට - ශ්‍රී ලංකාවේ සිටින ලේඛක විචාරක දෙපළම මෙහි වසන අපගේ ලේඛකයන් සහ කවීන් ඉදිරිපත් කරන පොත පත වෙත හෙළන බැල්ම ඒ තරම් හිතකර නොවන නිසා ය. ඒ අතින් ද මට වඩා වාසනාවක් හිමි වූ කිහිප දෙනෙක්ම අප අතර සිටිති.

ජගත් ජේ එදිරිසිංහ ස්වර්ණකාන්ති රාජපක්ෂ රසික සූරියාරච්චි සුනිල් ගෝවින්නගේ සහ පාලිත ගනේවත්ත ඒ අතින් කැපී පෙනෙති. මා කිහිප තැනක සඳහන් කළ පරිදි මෙරට මුල් පදිංචිකාරයන් ගැන ජනතාව දක්වන ආකල්ප සැලකිල්ල ලේඛකයන්ටත් පොදු ලක්ෂණයක් වන තරමට දක්නට ලැබීමද අපූරුවක් නොවේ. ඒ අතින්ද කැපී පෙනෙන - ඔවුන් ගැන - ඔවුන්ගේ දුක ගැන ලියූ දෙනෙකුගෙන් එකකු ලෙස ලක්ස්මන් හැඳින්විය යුතුය. අනෙක් ලේඛකයා පැර්ත් වාසී සුනිල් ගෝවින්නගේ ය.




න් දෙදෙන කවි ඔස්සේ ආදි වාසී දිවිය වෙත නෙත් යොමු කළහ. මෙරට ජනතාව කෙරෙහි - ජන දිවිය හා සොබා දහම වෙත නෙත් යොමු කළ ලේඛකයෝද කිහිප දෙනෙක් සිටිති. සිඩ්නිවාසී සමන් මහානාම දිසානායක ගේ නවකතා එකක වත් ඒ දිවිය හා මෙහි වසන සුදු මිනිසුන් දැක ගත හැකිය. පාලිත ගනේවත්ත ලියූ "ඇවිත් නොරටක" නවකතාව අවසන් වන්නේ සුදු ඕස්ට්‍රේලියානුවකු සමග ඇති කර ගන්නා බැඳීමකින් ය. විද්‍යානි මනතුංගගේ "හිම බිමේ සුදු රෝස" නම් නවකතාවේද සුදු ඔසී චරිතයක් ඇත . විනීතා විජේරත්නගේ "කැන්ගරු දේශය" නම් වන නවකතාව මෙරට සිදු වන සංචාරයක් ද ඇතුළත් කෘතියකි. පියසේන පට්ටිආරච්චිගේ " රටකින් එහා" කෙටි කතා එකතුවේ එන එක කතාවක් අසල්වැසි සුදු මිනිසකු සමග හටගත් සබඳතාවක් මැනැවින් නිරූපණය කරන්නකි. කන්තෝරු දිවිය විමසුම් නෙතට ලක් කරන තවත් කතාවක් ඒඑ කතුවේ එයි. කැන්බරාවාසී තවත් ලේඛිකාවක වන ප්‍රමිතා රෝහිණී ගුණරත්න මුලින් ලියූ "සඳුට මුවාවෙන්" සංග්‍රහයේ එන කෙටි කතාවක උයනක සක්මන් කරන ඔසී පවුලක් ගැන කියැවෙයි.

ලක්ෂ්මන් කොඩිතුවක්කු මේ අතින් ද අනෙක් ලේඛකයන් පරයා යන්නේ මෙරට ට සුවිශේෂ වූ සොබා දහමේ ලක්ෂණ සහ සතා සීපාවන් සිය නිමැවුමකට ගොණු කර ගැනීමෙනි. "මේ අපේ රටයි" නමින් ඔහු පළ කරන ළමා කතාවට විෂය කොට ගෙන ඇත්තේ මෙහි වසන සතුන් හා මෙරටට විශේෂ වූ ලැව් ගින්නය.

නිර්මාණකරුවා සිය නිමැවුම් සඳහා යොදා ගන්නේ තමා අත්දුටු හා නෙත් දුටු දේ ය. එය තහවුරු කරමින් ලක්ෂ්මන් කොඩිතුවක්කු සිය කෙටි කතා සඳහා පදනස කරගන්නේ දෙරටේදීම ලද අත්දැකීම් ය. මා මුලින් සඳහන් කළ අයුරු ඔහුගේ නිරීක්ෂණ ශක්තිය මෙන්ම ප්‍රතිභා ශක්තිය ද සෑහෙන අයුරින් දියුණු වූ බව මෙවර පළ කරන කෙටි කතා සියල්ලෙන්ම පෙනී යයි. පාලිත ගනේවත්ත ලියුවේ මෙහි අවුත් දරුවන් සමග ජීවත් වන දෙමාපියන් විඳින මානසික වදය ගැන ය. කොඩිතුවක්කු ඒ මානසික අසහනය දකින්නේ එරට තනිවූ දෙමාපියන් තුළ ය. දුක් විඳිමිනි ඇති දැඩි කොට ලොකු මහත් කළ - උසස් අධ්‍යාපනයක් ලබා දී රටට සමාජයට දායාද කළ දූ දරුවන් තමන් අතහැර පිටරට ගොස් හාවා හඳ දැක්කා වාගේ ඉඳ හිට අවුත් තෑගි බෝග දී යන අතර සැලකිය යුතු වියදමක් දරා පරිගණකයක් ද පූජා කොට ඒ මගින් සිය මාපියන් සමග නිරන්තර සංවාදයක් - සබඳතාවක් පැවැත්වීම ඔවුන්ගේ අරමුණ ය. අපේක්ෂාව ය. එහෙත් ඒ දූ දරුවන්ගේ මාපියන් පත්වන්නේ දුරස්ථ සමීපතාවක් පවත්වාගෙන යන තැනටය.

වයසක මනුස්සයාට එහි ඇති ගැම්මක් නැත . රට ගිය පුතා පිරිනැමූ පරිගණකය අසල්වැසි අහිංසක දරුවකුට තෑගි කරන්නේ ඒ දුක්බර යථාර්ථය තහවුරු කරමින් ය. "අවුරුදු කුමාරයා" කතාව කියන්නේ ඒ පුවත ය.

"ප්‍රතිමාවක් සංක්‍රමණිකයෙක් සහ දරුවෙක්" නමින් එන කතාව සරණාගතයන් ගැන කියන අතරම අපේ මව් බිමේ සිට අරන් ආ ගති ගුණ ද ඉස්මතු කර පෙන්වන්නකි. ගතිගුණ වලට වඩා යල් පැනපු ආකල්ප ගැන කියන කතාවකි. " බත්මුල" හා "බෝතල් පත්තරකාරයා" යන කතා දෙකෙන්ම ඔහු අහිංසක මිනිසුන්ගේ දිවි සටන වෙත එබී බලා අපට කියා දෙන්නේ දරු පවුලක් රැකීමට දරන නිමක් නැති ආයාසයකි. වැටි වැටී යන ගමනකි.

"මූණු පොතෙන් උපන් පුතෙක්" නමින් එන ටේකතා වමට කරන්නේ ප්‍රකට ලේඛිකාවන් දෙ-දෙනකි. එක් සිනමා අධ්‍යක්ෂවරියකි. සාමා-න්‍යයෙන් පුරුෂ පක්ෂයට නොපෙනෙන - දුටුවත් නොතකන - ගැහැනියකගේ දරුපෙම සහ ඒ දරුවා වෙනුවෙන් ඇය දරන වෙහෙස - කරන පිරිත්‍යාගය - ලක්ෂ්මන්ටද හමු වී ඇත. දිවයිනේ ප්‍රකට ලේඛකයන් පවා ගැරහීමට ලක් කළ "කන්-දක් සේ මා" "පොදු පුරුෂයා" බඳු නවකතාවලින් ද ඉනෝකා සත්‍යාංගනී ගේ "සුළං කිරිල්ලී" නම් සිනමා නිර්මාණයෙන් ද ඉදිරිපත් කරන කාන්තාවකගේ ප්‍රාර්ථනා සහ කැපවීම මුහුණු පොතේ උපන් පුතෙක් පුවතට අයත් හේමන්ති ගේ පරිත්‍යාගයද යට කී කාන්තාවන් කියන කතාවම වෙනත් අයුරකින් කියාපෑමකි.

සාරධා සහ තාත්තා හිතාගන්න බැරි මිනිහෙක් මාස්ටර් කුඩම්මා පතොක් මල් පෝච්චිය යනුවෙන් එන අනෙක් කෙටි කතා තුළින්ද ලක්-ස්මන් පළ කරන පරිනතභාවය හා නිර්මාණාත්මක බව අගය කළ යුතුය.

වරින් වර ඔහු භාවිතා කරන උපමා ද මම අගය කරන්නෙමි. නිදසුන් කීපයක් දක්වමි.

"ආදායම් වාර්තා බිඳ දමමින් දුවන චිත්‍රපටයක ප්‍රධාන නළුවා අබියස දුෂ්ඨයා පෙනී සිටින්නාක් මෙන් ඔහුගේ උරුවම්බෑවිල්ල එකවර නතර විය"

"නිදා සිටි බූරු ඇඳ රන් යහනාවක් සේ සිරුර වටේ එතී ගත සැහැල්ලු කළේ ය"

"මකුණන් මදුරුවන් විජිනිපත් ගෙන පවන් සළන්නාක් මෙන් ඔහුට සිහිනෙක් පෙනුණේ ය" (බෝතල් පත්තරකාරයා)

"ඌ හීන් හඬක් නගමින් ගේට්ටුවෙන් එළියට පැන්නේ කඳුළු ගෑස් වලට බයේ පැන දුවන වර්ජකයකු දුවන ගාණටය"

"ගායකයා පිළිබඳව කරන වර්ණනාව මාස්ටර්ට ඇහුණේ පොඩි දරුවකු සෙල්ලමට බැලුම් බෝලයක් පුම්බන්නාක් මෙන්" (මාස්ටර්)

ළමා කතාව කැන්ගරු පාසලක උගන්නා කැන්ගරු දරුවන් සහ ගුරු හාමිනේ ගැන කියන්නකි. (ගුරුතුමියට හාමිනේ යනුවෙන් ඇමතීම මා කුඩා අවදියේ ගමේ ඉස්කෝලේ පැවති පිළිවෙලය) කැන්ගරු නයිදේ කෙනකු අල්ලා ගත් මිනිසුන් පත්තු කරපු ගින්නෙන් හට ගත් ලැව් ගින්න විස්තර කරන කුවරයා මෙරට ආදිවාසීන් විසින් නොකඩවා රැක ගෙන ආ ගස් කොළන් - මහ වනය - ආරක්සා කිරීම ගැන කියා දෙන්නේ කැන්ගරු මුවකින් ය. ඔවුන් ගායනා කරන ගීය ද ඒ පාඩම ඉදිරිපත් කරන්නකි.

අනේ අපේ මිතුරනේ
ඇයිද හිතක් ඇති වුණේ
බුද්ධිමත්ම සතා වෙලත්
මනුස්සකම් දියවුණේ

ගිනි තියන්න එපා සිසිල
මැරෙයි ලොවම නැතිව වතුර
කැලේ රකිමු සැවොම මිතුර
හැමදාමත් හැමට උරුම
කැලේ රකිමු සැවොම මිතුර